## අභ්‍යවකාශ පුරාවෘත්තය...

මීර් වසර 15 ක් කක්ෂගත වූයේ පැයට කි.මී. 28780ක වේගයෙනි. එය 87600 වතාවක් පෘථිවිය වටා ගමන්ගෙන ඇත.




## අන්තිමේදී බිඳී ගිය හැටි




### අනතුරක් වෙයිද?

රුසියාව දැනටමත් ඩොලර් මිලියන 200ක රක්ෂණයක් මේ වෙනුවෙන් ලබාගෙන තිබිණි. ජපානය ද මේ සීමාව අසල පිහිටි රටක් වූ නිසා ආරක්ෂිත තැන් කරා යන ලෙස ඔවුනට උපදෙස් ලැබී තිබිණි. නවසීලන්ත රජය ද තම ජනයාට අනතුරු ඇඟවීම කළේ ය. මේ වැටීම නිරීක්ෂණයට යාම සඳහා රුසියානු අභ්‍යවකාශගාමී ඒජන්සිය, ඒ යන පුද්ගලයකුට ඩොලර් 6500 බැගින් වන්දියක් ලැබෙන සේ රක්ෂණ ආවරණයක් ලබා ගත්තේ ය. එහෙත් වාසනාවට මෙන් මීර් අවසන් ගමන් ගියේ කිසිවකුටත් හිංසාවක් පීඩාවක් නොකරමිනි.








# මීර් පිළිබඳ නොකියවුණ කතාව

ඔබ කවදක හෝ මීර් යානයෙන් අශ්‍යවකාශගත වූ කෙනෙක් නම් ගමනට කලින් මුත්‍රා කොට තිබීමේ වැදගත්කම කෙතෙක්දැයි වටහා ගනු ඇත. මක් නිසාද යත් මුත්‍රා බරද සහිතව ඔබ ඉහළට ගියා නම් ඉහළ දී ඇතිවන පීඩන වෙනස්කම් දරා ගැනීමට ඔබට අපහසු වනු ඇත. මෙසේ කලින් මුත්‍රා කිරීමේ කතාව කවුරුන්වත් ඊට අදාළ සැබෑ නමින් හඳුන්වන්නේ නැත. එය හැඳින්වෙන්නේ ලේස් තිසි ලෙස ගැට ගසා ඇද්දැයි පිරික්සීම කියා යි.

දැන් මේ ලේස් පිරික්සීම ගැන කථා කරන්නට කවුරුත් උනන්දු වන්නේ නැත. ඊට හේතුව මීර් යානය දැනටමත් සැලසුම් කළ අනතුරක් හරහා අවසන් ගමන් ගොස් තිබීම යි. ටොන් 130ක් බර මීර් යානය දැන් සුන්බුන් බවට පත් ව දකුණු පැසිපික් සාගරයේ , ඕස්ට්‍රේලියාවේ හා චිලියේත් යම් යම් තැන්වලට වැටී ඇත. මෙම ටොන් 130ක් බර යානය කොටස් 1500කට පමණ කැඩී යනු ඇතැයි කලින් අනාවැකි පළ කෙරිණ. එසේ වැටෙන කැබලිවල බර කිලෝ ග්‍රෑම් 450ක් හෝ ඊට ආසන්න විය හැකි ය. මෙසේ කැබලි වී වැටෙන්නේ ගිනි ගෙන ඉතිරි වූ කොටස් ය. මීර් යානය බිහි කිරීම උදෙසා පර්යේෂණ 16500 ක් පමණ සිදුකොට ඇති අතර ඉන් 600 ක් පමණ ම නිර්මාණාත්මක කාර්මික තාක්ෂණ අත්හද බැලීම් ය. මීර් යානය කක්ෂයේ වසර 15 ක් සැරිසැරූ අතර, මීර්යානය තම නිවසම කර ගත් 104 කින් සමන්විත මීර් කණ්ඩායම දින 438 ක් එහි ගතකොට ඇත. මේ වසර 15 තුළ පෘථිවිය වටා 87,600 වාරයක් පමණ ගමන් කොට ඇති අතර එය සතුව පැවතියේ පැයට කිලෝමීටර 28780ක වේගයකි. යානය තාරකා විද්‍යාත්මක පර්යේෂණ ඇරඹුවේ 1987 අප්‍රේල් මාසයේ දී ය.

දිගු කාලයක් අභ්‍යාවකාශයේ ම රැඳී සිටිනා අභ්‍යවකාශගාමීන්ට මුහුණ දෙන්නට සිදුවන හැම අභියෝගයකට ම මීර් හි 104 කණ්ඩායම ද මුහුණ දුන්හ. හුදෙකලාව, ලිංගික ඇසුර නැතිකම වැනි දේ ද ඒ අතර විය. අභ්‍යවකාශයේදී කෙරෙන ජීව විද්‍යා පර්යේෂණවල කොටසක් ලෙස (සත්ත්ව ප්‍රජනනය පිරික්සනු සඳහා) ලව්බර්ඩ් කුරුලු ජෝඩුවක් ගෙන ගිය අතර යළි ඒමට පෙර ඔවුන් මිය ගොස් තිබිණි. යානයේ සිටි අයගේ ලිංගික ජීවිතය (මේ කාලය තුළ) මීට වඩා යහපත් වූවා නම් ඒ ඉතාමත් සුළු වශයෙනි. එය බොහෝ විට සිහින දැකීමට ම සීමා විය. නැතහොත් උද්‍යසත එකිනෙකාගෙන් අසාගන්නා විහිළු ප්‍රශ්න කීපයකට සීමා විය.

විනෝදය හා විවේකය ද බෙහෙවින් සීමාසහිත දෙයක් විය. අලුත් අවුරුද්දට එළැඹීම සැමරීම සඳහා කිසිදු ආගමකට අයත් නොවන කුඩා සාද ගසක් තනන්නට නම් ඔවුනට ඉඩ ලැබිණි. අප්‍රේල් පළමුවැනිද උසුළු විසුළු කරන්නටත් ඔවුහු අමතක නොකළහ. 1988 අප්‍රේල් පළමුවැනිද අභ්‍යවකාශගාමී මූසා මැකරොව් පාලක මැදිරියට වාර්තා කර සිටියේ අපූර්ව දෙයකි. එනම් තමා බලාපොරොත්තු නොවූ පරිදි අභිරහස් අංක වගයක් දුටු බව ය.

මේ පණිවුඩය ලබා ගත්තේ පාලක මැදිරියේ ව්ලැඩිමීර් බෙසිළුම් ය. ඔහු මේ පුවත පාලක මැදිරියේ සිටි අත් අයට ලබා දුන්නේ ය. ඔවුහු එය විශ්වාස කළ අතර ඒ අංක ජායාරූප ගත කරන්නට ද උපදෙස් නිකුත් කළ හ.

මීර් ගැන බොහෝ දෙනා කතා කරන්නට පටන් ගත්තේ 1990දී එය පත්වූ අනතුර හරහා ය. එය 1997 දී ද මිනිසුන් රහිත බඩු ප්‍රවාහන යානයක් සමග ගැටුණේ ය.

වැඩි ප්‍රචාරයට පත් නොවූ තවත් අපූර්ව සිද්ධියක් වන්නේ අභ්‍යවකාශගාමී ඇලෙක්සැන්ඩර් සෙරෙබ්‍රොව් අභ්‍යවකාශය මත ඇවිදිමින් සිටියදී ආරක්ෂක රැහැනෙන් මිදී ගිය අවස්ථාවයි. ඒ අවස්ථාවේදී ඔහු තවම ම චන්ද්‍රිකාවක් බවට පත්වූවා යැයි කිවහොත් නිවැරදි ය. වාසනාවට මෙන් ඔහුට අනතුරක් සිදුවන්නට පෙර මධ්‍යස්ථානයට සම්බන්ධ වන්නට හැකි විය. 1994 දී මීර් හි දිශානතිය නැති වී ගිය අතර ඔක්සිජන් පරිවහනය සිදු කරමින් තිබූ පංකාවන්ගේ කාර්යයන් ද අඩාල වී ගියේ ය. ජීවිතය පවත්වාගෙන යන්නට වඩාත් නිවැරදිව කියනවා නම් හුස්ම ගැනීම සඳහා අත්වලින් වාතය එකතු කර ඇද ගන්නට ඔවුනට සිදු විය. මීර්වල බල සැපයුම් ගැටලුව විසඳෙන තුරු ම අතෙන් ඔක්සිජන් වායුව ඇද ගන්නටත් කාබන් ඩයොක්සයිඩ් තල්ලු කර දමන්නටත් ඔවුනට සිදු විය. – **මනෝජ්**

